# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject: Economics** **Grade 13** **Medium: Sinhala**

1. (i) නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ඉහළ යාම වඩාත් ප්‍රායෝගික තත්වයයි. ඊට පක්ෂව දැක්විය හැකි හේතු මොනවාද? (ලකුණු 04යි)

   (ii) අ. නිෂ්පාදන සාධකවල ඵලදායිතාව යන්න පැහැදිලි කරන්න.

   ආ. ඵලදායිතා සංකල්පයේ ඇති ප්‍රයෝජන මොනවාද?

   ඇ. ඵලදායිතාව තීරණය කරන සාධක නම් කරන්න.

   (ලකුණු 04යි)

   (iii) ආර්ථික කාර්යක්ෂමතාවය සඳහා ඉටු විය යුතු කොන්දේසි කවරේද? පැහැදිලි කරන්න.

   (ලකුණු 04යි)

   (iv) අ. ආර්ථික න්‍යාය තුළ නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනය යනුවෙන් කුමක් අදහස් වේද?

   (ලකුණු 02යි)

   ආ. මුදල් ප්‍රාග්ධනය ලෙස නොසැලකෙන්නේ මන්ද? (ලකුණු 02යි)

   (v) නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ශූන්‍ය විය හැක්කේ කිනම් තත්ත්වයක් යටතේද?

   (ලකුණු 04යි)

2. (i) නිෂ්පාදන සම්පත්වල "ඵලදායිතාව" යන්න පැහැදිලි කර එය තීරණය කරන සාධක නම් කරන්න.

   (ලකුණු 05යි)

   (ii) ආවස්ථික පිරිවැයකින් තොරව සියළු භාණ්ඩ හා සේවාවල නිමැවුම් වැඩිකරගත හැක්කේ කිනම් තත්ත්වයක් යටතේදැයි රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

   (ලකුණු 05යි)

   (iii) පරිගණක යන්ත්‍ර සහ රූපවාහිනි යන්ත්‍ර නිපදවන ආර්ථිකයක් උපකල්පනය කරන්න. තවද නිපදවනු ලබන සෑම පරිගණකයක් වෙනුවෙන් රූපවාහිනි යන්ත්‍ර දෙකක් කැප කරන්නේ යැයිද සිතන්න.

අ. ඔබගේ සංඛ්‍යා යොදාගනිමින් නිෂ්පාදන හැකියා ලේඛනය ගොඩනගන්න.

(ලකුණු 01යි)

ආ. කල්පිත ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව රූප සටහනක දක්වන්න.

(ලකුණු 02යි)

ඉ. ඔබ ඇඳි නිෂ්පාදන හැකියා වක්‍රයේ විශේෂිත හැඩයට හේතු දක්වන්න.

(ලකුණු 01යි)

ඊ. පරිගණක නිෂ්පාදනයේ ඵලදායිතාව 50% කින් ඉහළ ගියේ යැයි සිතන්න. එම තත්ත්වය රූප සටහනෙහි දක්වා පරිගණක නිෂ්පාදනයේ නව ආර්ථික ආවස්ථික පරිවැය ගණනය කර පෙන්වන්න.

(ලකුණු 05යි)

3. (i) පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීම යනුවෙන් අදහස් වන්නේ "සලකා බලන කාලය තුල නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට යෝග්‍ය සියලු සම්පත් නිෂ්පාදනය සඳහා භාවිතයට ගැනීමයි" මෙහි නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට යෝග්‍ය සියලු සම්පත් යනුවෙන් කුමක් අදහස් වේද?

(ලකුණු 04යි)

(ii) ආර්ථික විද්‍යාවේදී නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනය යන සංකල්පය හඳුන්වනුයේ මූර්ත සංකල්පයක් වශයෙනි. මෙම ප්‍රකාශයෙන් ඔබට කුමක් අදහස් වේද?

(ලකුණු 04යි)

(iii) සම්පත් හිඟකම සෑම සමාජයකටම කේන්ද්‍රීය ආර්ථික ප්‍රශ්නය වනුයේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iv) හිඟ සම්පත් වර්තමාන පරිභෝජනය වෙතින් ආයෝජනය වෙතට විතැන් කරනු ලැබුවහොත් ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය වේගවත් කරගත හැකි ආකාරය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(v) කිසියම් ආර්ථිකයකට නිෂ්පාදන හැකියා මායිම මත ප්‍රශස්ත භාණ්ඩ සංයෝගය නිපදවීමට හැකියාවක් ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

4. (i) සම්පත් පිරිවැයකින් තොරව ආර්ථික භාණ්ඩ බිහි නොවීමට හේතු මොනවාද?

(ලකුණු 04යි)

(ii) යම් භාණ්ඩයක හෝ සේවාවක ආවස්ථික පරිවැය ශූන්‍ය විය හැක්කේ කිනම් තත්වයක් යටතේද?

(ලකුණු 04යි)

(iii) ආර්ථික පසුබැසීමකට වඩා වැඩි යමක් ආර්ථික අවපාතයක් මගින් අදහස් වේ. පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iv) මානව ප්‍රාග්ධනය යනුවෙන් කුමක් අදහස්වේද? එය නිෂ්පාදන ආයතන කෙරේ කවර ආකාරයකින් බලපානු ඇත්ද?

(ලකුණු 04යි)

(v) ආර්ථික කාරකයක් වශයෙන් රජයේ කාර්ය භාර්ය යටතට ඇතුලත් කරන දෑ මොනවාද?

(ලකුණු 04යි)

5. (i) සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව යනුවෙන් කුමක් අදහස්වේද? ඒ සඳහා නිෂ්පාදන හැකියා වක්‍රය යොදා ගත හැක්කේ කෙසේද ?

(ලකුණු 04යි)

(ii) සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාවය ඇති කිරීමෙහි ලා වෙළඳපොල ආර්ථිකයක ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයට මැදිහත් විය හැක්කේ කෙසේද ?

(ලකුණු 04යි)

(iii) වෙළඳපොල ක්‍රමය තුළ මිල සලාකන මාධ්‍යක් ලෙස ක්‍රියා කරනු ලබන්නේ කෙසේද?

(ලකුණු 04යි)

(iv) වෙළඳපොල ආර්ථිකයකට සාපේක්ෂව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට හැකිවීම විධානගත ආර්ථික පද්ධතියකට පක්ෂව නැගෙන ප්‍රබල තර්කයකි. පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(v) ආවස්ථික පිරිවැය ඉහළ නංවමින් නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට නෙරායමකට බලපෑ හැකි සාධක මොනවාද? (ලකුණු 04යි)

6. (i) භාණ්ඩයක් සඳහා වන "වුවමනා" සහ "ඉල්ලුම" සමාන සංකල්ප නොවන බව ඔබ පැහැදිලි කරන්නේ කෙසේද?

(ලකුණු 04යි)

(ii) Qd = 40-5p සමීකරණයට අදාල ඉල්ලුම් වක්‍රය රූප සටහනක දක්වන්න.

(ලකුණු 04යි)

(iii) පෞද්ගලික ඉල්ලුම සහ වෙළඳපොළ ඉල්ලුම අතර වෙනස දක්වන්න.

(ලකුණු 04යි)

(iv) ලක්‍ෂ මිල නම්‍යතාව පැහැදිලි කර එය ගණනය කරන ආකාරය දක්වන්න.

(ලකුණු 04යි)

(v) X භාණ්ඩයේ මිල වැඩි වන විට අලෙවි අයභාරය ඉහළ යන ලදී. එහෙත් Y භාණ්ඩයේ මිල අඩු වන විට අලෙවි අයභාරය වැඩි වේ. එවැනි වෙනසකට හේතු ලෙස සැලකිය හැක්කේ කවරක්ද? පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

7. එක්තරා භාණ්ඩයක සරල රේඛීය ඉල්ලුම සැපයුම් වක්‍ර පහත දැක්වේ

Qd = 60 – 2P (ඉල්ලුම් වක්‍රය)

Qd = 30 + 4P (සැපයුම් වක්‍රය)

(i) වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය තිරණය කරන්න.

(ලකුණු 02යි)

(ii) සමතුලිත මිලේදී සැපයුම් නම්‍යතාව කොපමණද?

(ලකුණු 03යි)

(iii) මෙම භාණ්ඩය සඳහා රජය රු. 20 ක අවම මිලක් නියම කලේ නම් අධික සැපයුම ගණනය කරන්න.

(ලකුණු 03යි)

(iv) අවම මිලෙන් පසු නිෂ්පාදකයාට වෙළඳපොලෙන් උපයා ගත හැකි අලෙවි අයභාරය කොපමණද?

(ලකුණු 02යි)

(v) අවම මිලෙන් පසු සමස්ථ සැපයුම අලෙවි විය හැකි ඒකක මිල කොපමණ ද?

(ලකුණු 03යි)

(vi) අවම මිල සහතික මිල බවට පත් කිරීමට නම් රජය ඒකකයක් සඳහා තව කොපමණ මුදලක් නිෂ්පාදකයාට ලබා දිය යුතු ද? (ලකුණු 03යි)

(vii) සහතික මිලෙන් පසු පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න.

(ලකුණු 04යි)

8. (i) සමාජයක් විසින් විසඳා ගතයුතු මූලික ආර්ථික ප්‍රශ්න මොනවාද?

(ලකුණු 04යි)

(ii) එම ගැටළුව විසඳා ගැනීමේදී විධාන ගත සහ වෙළඳපොල ආර්ථිකයක් ක්‍රියාත්මක වන්නේ කෙසේද?

(ලකුණු 04යි)

(iii) වෙළඳපොළ ආර්ථිකය ලාභය සානුබල මුලාශ්‍රයක් ලෙස සැලකේ.

අ. “සානුබල” යනුවෙන් කුමක් අදහස් වේද?

ආ. වෙළඳපොළ ආර්ථිකයක ලාභයට පැවරෙන කාර්යභාරය නම් කරන්න.

(ලකුණු 04යි)

(iv) “වෙළඳපොල ආර්ථිකයක මිල සංඥා මාධ්‍යකි”. පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(v) සැළසුම්ගත ආර්ථිකයක අවාසි මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු04යි)

9. (i) ඉල්ලුම තීරණය කරන සාධකයක් ලෙස සම්බන්ධිත භාණ්ඩවල මිල ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(ii) යම් භාණ්ඩයක් සඳහා වූ ඉල්ලුම් වක්‍රයකින් සහ එකී වක්‍රය මත වූ ලක්ෂයකින් කුමක් අදහස් වන්නේද?

(ලකුණු 04යි)

(iii) එක්තරා භාණ්ඩයක් සඳහා සතියක් තුළ හැසිරෑ වෙළඳපොල දත්ත කිහිපයක් පහත දැක්වේ.

| මිල රු | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|
| 4 | 90 |
| 10 | 30 |

අ. මෙම භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රයට අදාල සමීකරණය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 02යි)

ආ. සමීකරණය භාවිතාකර ඉල්ලුම් ප්‍රමාණය ශූන්‍ය විය හැකි මිල ගණනය කරන්න.

(ලකුණු 01යි)

ඇ. පාරිභෝගිකයින් ඒකක 100 ක් මිලට ගත හැක්කේ කවර මිලක දීද?

(ලකුණු 01යි)

10. (i) "වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය" පැහැදිලි කරන්න. වැඩිවන ආර්ථික පරිවැය වඩාත් ප්‍රායෝගික තත්ත්වයක් ලෙස සැලකිය හැකි හේතු මොනවාද?

(ලකුණු 04යි)

(ii) සමාජයක් විසින් තේරීම් කිරීමේදී බිහිවන පිරිවැය සුදුසු රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iii) "සමාජයක පවත්නා හිඟ සම්පත් වඩාත් කාර්යක්ෂමව නිෂ්පාදනයට උපයෝජනය කල යුතුය" මින් ඔබට කුමක් අදහස් වේද?

(ලකුණු 04යි)

(iv) "වුවමනා" සහ "හිඟකම" අතර ගැටුම සම්පත් පිරිමැස්මෙන් භාවිතා නොකිරීමේ ප්‍රතිඵලයකි. මෙම ප්‍රකාශයේ වලංගුතාව පරීක්ෂා කරන්න.

(ලකුණු 04යි)

(v) ආවස්ථික පිරිවැය පැහැදිලි කිරීමට නිෂ්පාදන හැකියා වක්‍රය යොදාගත හැක්කේ කෙසේද?

(ලකුණු 04යි)

11. (i) යම් නිෂ්පාදන ආයතනයක් පූර්ණ තරඟකාරී කර්මාන්තයේ ආයතනයක් ලෙස හඳුනාගැනීමට යොදාගත හැකි නිර්නායක කවරේද?

(ලකුණු 04යි)

(ii) පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී නිෂ්පාදනයේ නිරතවීමට පෙළඹෙන්නේ ආර්ථික ලාභ පවතිනම් පමණි. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේ දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iii) පූර්ණ තරඟයේ ආයතනයක් පැවරුණු මිලකට මුහුණ දීම යනුවෙන් කුමක් අදහස් වේ දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iv) ඒකාධිකාරී තරඟයේ ආයතනයක් පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයකින් වෙන් කොට දැක්විය හැක්කේ කෙසේද?

(ලකුණු 04යි)

(v) පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක ආන්තික අයභාර වක්‍රය සහ ආන්තික පිරිවැය වක්‍රය එම ආයතනයේ සැපයුම තීරණය වීම කෙරේ බලපාන්නේ කෙසේද?

(ලකුණු 04යි)

10. (i) නිෂ්පාදන ආයතනයක කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස දක්වන්න.

(ලකුණු 04යි)

(ii) කෙටි කාලීන පිරිවැය වක්‍ර ඉංග්‍රීසි U අකුරේ හැඩය ගන්නේ ඇයි?

(ලකුණු 04යි)

(iii) පූර්ණ තරඟයේ ආයතනයක් කෙටි කාලයේ දී ඒකකයට ලැබෙන මිල අවම සාමාන්‍ය මුළු පිරිවැයට අඩුවන තත්ත්වයක් යටතේ වුවද නිෂ්පාදනයේ දී යෙදී සිටීමට තීරණය කළ හැක. ඊට පක්ෂව ඉදිරිපත් කල හැකි තර්ක මොනවාද?

(ලකුණු 04යි)

(iv) "ආර්ථික ලාභය" සහ "ගිණුම්කරණ ලාභය" අතර වෙනස දක්වන්න.

(ලකුණු 04යි)

(v) නිෂ්පාදන ආයතනයක් "ආර්ථික ලාභ" ඉපැයීම සාධාරණීකරණය කල හැකි කරුණු මොනවාද?

(ලකුණු 04යි)

13. (i) භාණ්ඩයක මිල අඩු වන විට පාරිභෝගිකයින් එම භාණ්ඩය වැඩි වැඩියෙන් මිලට ගන්නේ ඇයි?

(ලකුණු 04යි)

(ii) බාල භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම, ඉල්ලුම් නීතියට එකඟ විය හැකි යැයි ඔබ සිතන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) "ගිෆන් භාණ්ඩයක" ඉල්ලුම් නීතියට එරෙහිව ක්‍රියාත්මක වේ යැයි පැවසෙන්නේ ඇයි?

(ලකුණු 04යි)

(iv) භාණ්ඩයක සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපාහැකි සාධක නම්කරන්න.

(ලකුණු 04යි)

(v) "සැපයුම් නීතිය" පැහැදිලි කර ඊට බලපාන සාධක දක්වන්න.

(ලකුණු 04යි)

14. (i) නිදහස් තරඟකාරී සමතුලික වෙළඳපොලක සැපයුමේ වෙනසක් නොමැතිව භාණ්ඩයේ මිල ඉහළයාමට බලපෑ හැකි සාධක නම් කරන්න.

(ලකුණු 04යි)

(ii) "ඉල්ලුම් නීතිය" පැහැදිලි කර එහි ප්‍රායෝගික වලංගුතාවය පරීක්ෂා කරන්න.

(ලකුණු 04යි)

(iii) A, B හා C යන භාණ්ඩ වර්ග තුනෙහිම මිල 10% කින් වැඩි කළද ඉල්ලුම් ප්‍රමාණය පහළ වැටීමේ අනුපාතයන් අතර අසමානතාවයක් දැකිය හැකි විය. එවැනි වෙනසකට පදනම් විය හැකි යැයි ඔබ හිතන හේතු මොනවාද?

(ලකුණු 04යි)

(iv) පහත සඳහන් එක් එක් සිදුවීම් සෙවිලි තහඩු වෙළඳපොල සැපයුම් වක්‍රය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

අ. සෙවිලි තහඩු නිෂ්පාදනයට යොදා ගැනෙන අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම

ආ. සෙවිලි තහඩු නිෂ්පාදන කර්මාන්තයට අළුතින් ආයතන ප්‍රවේශවීම.

(ලකුණු 04යි)

(v) අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී නම් මිලත් සැපයුමත් අතර අනුලෝම සම්බන්ධයක් බිහි වීමට හේතු මොනවාද?

(ලකුණු 04යි)

15. (i) ඉල්ලුම් වක්‍රයේ බෑවුම සහ නම්‍යතාව අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(ii) අනිකුත් කරුණු ස්ථාවරව පවතී නම් භාණ්ඩයක මිල වෙනස්වන විට ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වන වේගය අඩු හෝ වැඩි විය හැක. එසේවන්නේ ද? පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 04යි)

(iii) භාණ්ඩයක මිල ඉහළ යන විට ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක ඉල්ලුම් නීතිය තහවුරු කරමින් ඉල්ලුම් ප්‍රමාණය අඩුවන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iv) දෙන ලද අවස්ථාවක බඩ ඉරිඟු වෙළඳපොල රේඛීය ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත දැක්වේ.

ඉල්ලුම් රේඛාව QD = 200 – 5P      සැපයුම් රේඛාව Qs = -50 + 5P

අ. ඉහත තොරතුරු ප්‍රස්ථාර සටහනක දක්වා වෙළඳපොල සමතුලිත මිල සහ ප්‍රමාණය තීරණය කරන්න.

(ලකුණු 02යි)

ආ. බඩ ඉරිඟු ගොවීන් දිරිගැන්වීමට නිපදවන සෑම බඩ ඉරිඟු කිලෝවක් සඳහා රජය රුපියල් 10 ක සහනාධාරයක් ලබාදීමට ක්‍රියාකලේ නම් පාරිභෝගිකයා බඩ ඉරිඟු කිලෝ එකක් සඳහා ගෙවන මිල කොපමණද?

(ලකුණු 02යි)

ඉ. රජයේ සහනාධාර පිරිවැය කොපමණද?

(ලකුණු 02යි)

ඊ. සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තයේ සිදුවූ වෙනස කොපමණද?

(ලකුණු 02යි)

16. (i) නිෂ්පාදන ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු කිරීමේ දී සැලකියල්ලට නොගැනීම නිසා ඉන් බැහැර කෙරෙන එලදායී ආර්ථික කටයුතු මොනවාද?

(ලකුණු 04යි)

(ii) "රටක සියළුම නිෂ්පාදන ආයතනවල නිමැයුමේ මූල්‍යමය වටිනාකම ඇස්තමේන්තු කර ඒවා එකට එකතු කිරීමෙන් අදාල වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කල හැකිය."

මෙම ප්‍රකාශය සමඟ ඔබ එකග වන්නේ දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iii) අ. සැඟවුණු ආර්ථික ක්‍රියා පැවතීම රටක දළ දේශීය නිෂ්පාදනය කෙරේ කෙබඳු බලපෑමක් ඇති කරන්නේද? (ලකුණු 03යි)

ආ. එවැනි ආර්ථික ක්‍රියා වළක්වාලීමය හෝ අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග මොනවාද? (ලකුණු 03යි)

(iv) කල්පිත ආර්ථිකයක ජාතික ආදායම සම්බන්ධ තොරතුරු සමූහයක් පහත දැක්වේ. (අගයන් රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| - | ව්‍යාපාර ආයතනවල දළ ලාභ | 1,200 |
| - | ශ්‍රමික ඉපයීම් සහ අනෙකුත් ප්‍රතිලාභ | 2,000 |
| - | ව්‍යාපාර ආයතන විසින් බෙදාහල ලාභ | 400 |
| - | බදු කුලී ආදායම | 800 |
| - | වෘත්තිකයින්ගේ ආදායම් | 350 |
| - | සමාගම් ලාභ මත ගෙවූ බදු | 250 |
| - | කුටුම්භයන්ට ලැබුණු සංක්‍රාම | 150 |
| - | ප්‍රාග්ධන ක්ෂයවීම් | 50 |
| - | පොලී ආදායම් | 700 |
| - | ප්‍රාථමික ආදායම් ශුද්ධ | -150 |
| - | ශුද්ධ වක්‍ර බදු | 100 |

ඉහත තොරතුරු භාවිතා කර,

අ. ආදායම් ප්‍රවේශය යටතේ වෙළඳ මිලට ශුද්ධ දේශීය නිෂ්පාදිතය.

(ලකුණු 02යි)

ආ. ජාතික ආදායම.

(ලකුණු 02යි)

ඇ. පෞද්ගලික ආදායම ගණනය කරන්න.

(ලකුණු 02යි)

17. (i) ව්‍යාපාර චක්‍රයක "පසු බැසීම" සහ "ප්‍රසාරණය" යන සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(ii) "නිමැවුම් පරතර" (OUTPUT GAPS) යනුවෙන් කුමක් අදහස් වේ ද? නිමැවුම් පරතර ආර්ථික ස්ථායිතාව නැමැති අරමුණු සමඟ ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(iii) පහත සඳහන් දෑ අතුරින් දළ දේශීය නිෂ්පාදිතය යටතට ගැනෙන ගණුදෙනු කවරේදැයි හේතු දක්වන්න.

අ. මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම

ආ. ව්‍යාපාර ආයතනවල අලෙවි නොවූ තොග ඉහළ යාම

ඇ. හිමිකරු සිය මෝටර් රථයෙන් පවුලේ සාමාජිකයින් ප්‍රවාහනය කිරීම

ඈ. මුද්‍රණ ආයතනයක් වෙනත් මුද්‍රණ ආයතනයකින් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම

(ලකුණු 05යි)

(iv) කල්පිත ආර්ථිකයකට අදාල පහත සඳහන් දත්ත ඔබට දී ඇත. (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 600 |
| ශුද්ධ අපනයනය | -100 |
| ප්‍රාග්ධන ක්ෂයවීම | 50 |
| ශුද්ධ විදේශ සාධක ආදායම | -50 |
| තොග වෙනස්වීම | 80 |
| ශුද්ධ විදේශ වර්තන ලැබීම් | 200 |
| රජයේ මිලදී ගැනීම් | 250 |
| ශුද්ධ අයෝජනය | 150 |

පහත දෑ ගණනය කරන්න.

1. දළ දේශීය නිෂ්පාදිතය.
2. වැය කළ හැකි දළ ජාතික නිෂ්පාදිතය
3. ජාතික ඉතුරුම් (ලකුණු 05යි)

18. (i) ආර්ථික විද්‍යාවේ නිෂ්පාදන පිරිවැය යනුවෙන් කුමක් අදහස්වේද?

(ලකුණු 04යි)

(ii) පහත සඳහන් දෑ ස්ථාවර හා විචල්‍ය පිරිවැය වශයෙන් වර්ගීකරණය කර දක්වන්න.

අ. දේපොල බදු　　ආ. ඉන්ධන පිරිවැය

ඉ. ප්‍රමාණික ලාභය　　ඊ. රක්ෂණ වාරිකය

උ. කොන්ත්‍රාත් පදනමින් ලබාගත් සේවක ප්‍රවාහන සේවාවේ පිරිවැය

(ලකුණු 04යි)

(iii) නිෂ්පාදනයේදී කෙටිකාලය හා දිගු කාලය වශයෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04යි)

(iv) හීනවන ඵල හා හීනවන පරිමාණානුකූල ඵල අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(v) එක්තරා නිෂ්පාදන ක්‍රියාවලියක ස්ථාවර යෙදවුම් වන ප්‍රාග්ධන ඒකකයක මිල රු. 10 කි. ශ්‍රම ඒකකයක මිල රු. 40 කි. නිමැවුම් මට්ටම් දෙකක් සඳහා අවශ්‍ය යෙදවුම් පහත වගුවේ දැක්වේ.

| නිමැවුම් මට්ටම (ඒකක) | ශ්‍රම ඒකක | ප්‍රාග්ධනය (ඒකක) |
|---|---|---|
| 40 | 4 | 10 |
| 50 | 5 | 10 |

අ. නිමැවුම් මට්ටම ඒකක 50 දී සාමාන්‍ය මුළු පිරිවැය සොයන්න. (ලකුණු 02යි)

ආ. නිමැවුම් මට්ටම 50 දී ආන්තික පිරිවැය සොයන්න. (ලකුණු 02යි)

19. (i) නිෂ්පාදන ක්‍රියාවලියේ කෙටි කාලය හා දිගුකාලය අතර වෙනස කුමක්ද?

(ලකුණු 04යි)

(ii) සාමාන්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iii) පරිමානානුකූල පිරිමැසුම් හා දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය අතර සම්බන්ධය කෙබඳුද?

(ලකුණු 04යි)

(iv) පූර්ණ තරඟයේ ආයතනය මිල අවශ්‍යයෙන්ම එම ආයතනයේ ආන්තික අයභාරය සහ සාමාන්‍ය අයභාරයට සමාන විය යුත්තේ ඇයි?

(ලකුණු 04යි)

(v) පූර්ණ තරඟකාරී ආයතනයක වියදම් ලේඛණයක් පහත දැක්වේ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රමාණය | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| මුළු පිරිවැය | 20 | 29 | 45 | 67 | 74 | 82 | 91 | 102 |

ඒකකයක මිල රු.7 ක් වුවහොත් ආයතනයේ කෙටිකාලීන සමතුලිත නිමැවුම් ප්‍රමාණය කොපමණද?

(ලකුණු 04යි)

20. (i) නිෂ්පාදන ක්‍රියාවලිය තුල කෙටි කාලය හා දිගු කාලය වශයෙන් ප්‍රභේද දෙකක් දැකිය හැක. ඒ සඳහා පදනම් වන හේතු දක්වා සංකල්ප දෙක අතර වෙනස පහදන්න.

(ලකුණු 04යි)

(ii) **"පරිමානානුකූල ඵල"** දිගු කාලීන සාමාන්‍ය පිරිවැය හැසිරීම කෙරේ බලපාන්නේ කෙසේද?

(ලකුණු 04යි)

(iii) පූර්ණ තරඟකාරී වෙළඳපොලක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක් කෙටිකාලයේදී නිෂ්පාදනයේ යෙදීමට අපේක්ෂා කරන අවම මිල කුමක්ද? පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 04යි)

(iv) කෙටි කාලයේදී නිෂ්පාදන ආයතනයක් ලාභ උපරිම වන නිමැවුම් මට්ටම තීරණය කරන ආකාරය ආන්තික විශ්ලේෂණය යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(v) ඒකාධිකාරී තරඟය සහ කතිපයාධිකාරය යන වෙළඳපොල ව්‍යුහයන්හි වෙනස මූලික ලක්ෂණ ඇසුරින් සැකෙවින් සඳහන් කරන්න.

(ලකුණු 04යි)

21. (i) සාර්ව ආර්ථික සමතුලිතය සුදුසු රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(ii) වියදම් ප්‍රවාහයෙන් සිදුවන “ගිලිහීම්” සහ “එකතුවීම්” යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iii) ආන්තික පරිභෝජන නැමියාව (MPC) සහ සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC) එක ම අගයක් ගනු ලබන තත්ත්වය රූ සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iv) කල්පිත සරල ආර්ථිකයක වැය කල හැකි ආදායම සහ පරිභෝජනය අතර සම්බන්ධතාවය පහත දැක්වේ.

(ලකුණු 04යි)

(v)

| වැඩි කල හැකි ආදායම (රු.මි) | පාරිභෝජනය (රු.මි) |
|---|---|
| **(Y)** | **( C )** |
| 1000 | 1000 |
| 2000 | 1800 |

අ. ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 02යි)

ආ. පාරිභෝජන ශ්‍රිතයට අනුරූපී ඉතුරුම් ශ්‍රිතය දක්වන්න.

(ලකුණු 02යි)

ඇ. පාරිභෝජනය සහ ඉතුරුම් ශ්‍රිතය අතර ඇති සම්බන්ධතාවය රේඛාව ($45^0$ රේඛාව) යොදා ගනිමින් රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 02යි)

22. (i) සමාහාර ඉල්ලුම හා සාර්ව ආර්ථික සමතුලිතය අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(ii) අ. $C = 200 + 0.8Yd$ යන පාරිභෝජන ශ්‍රිතය රූප සටහනකින් දක්වන්න.

ආ. $45^0$ රේඛාව රූප සටහනෙහි දක්වා ඉතුරුම් ශූන්‍ය වන ආදායම් මට්ටම නිර්ණය කරන්න.

(ලකුණු 04යි)

(iii) ස්වාධීන වියදම් ගුණකය පැහැදිලි කර එය ගණනය කරන ආකාරය දක්වන්න.

(ලකුණු 04යි)

(iv) a. සරල ආර්ථිකයක සමාහාර පාරිභෝජනය සහ ආයෝජනයට අදාල තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ස්වාධීන පාරිභෝජනය රුපියල් මිලියන | 200 |
| ආන්තික පාරිභෝජන නැමියාව | 90% |
| ආයෝජන ඉල්ලුම රුපියල් මිලියන | 100 |

අ. පාරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

ආ. සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 04යි)

b. මෙම ආර්ථිකයට රජය මැදිහත් වී රුපියල් මිලියන 120 ක් බදු වශයෙන් අයකර භාණ්ඩ හා සේවා මත රුපියල් මිලියන 300 ක් වැයකලේ යැයි සිතන්න.

ඇ. නව සමතුලිත ජාතික ආදායම කොපමණද ?

ඈ. සමතුලිත ආදායමේදී ඉතුරුම් කොපමණද ?

ඉ. ස්වාධීන වියදම් ගුණකය ගණනය කරන්න. (ලකුණු 08යි)

23. (i) නිෂ්පාදන ප්‍රවේශයේදී බැහැර කෙරෙන ඵලදායි නොවන වෙළඳපොළ ගණුදෙනු නම් කරන්න.

(ලකුණු 04යි)

(ii) "එකතුකල වටිනාකම" යනුවෙන් කුමක් අදහස්වේද? වෙළඳ පොල මිලට එකතු කල අගය තුල ඇතුලත් දෑ මොනවාද? (ලකුණු 04යි)

(iii) ආන්තික පාරිභෝජන නැමියාව 3/4 ක් වන සරල ආර්ථිකයක අනිකුත් කරනු ස්ථාවර වේ නම් ආයෝජන ඉල්ලුම රු.මි. 10 කින් පහළ යාමක් සිදුවුවහොත් නැවත ආර්ථිකයේ සමතුලිතතාවයක් බිහිවීම සඳහා ඉතුරුම් හා ආයෝජන සමානවීමට නිමැවුම හා ආදායම කෙතරම් ප්‍රමාණයකින් වෙනස් විය යුතුද?

(ලකුණු 04යි)

(iv) ආන්තික පාරිභෝජන නැමියාව (MPC) හා ආන්තික ඉතුරුම් නැමියාව (MPS) ඇති වැදගත්කම කුමක් ද?

(ලකුණු 04යි)

(v) අ. $C = a + by$ වන සරල ආර්ථිකයක, පරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිතය අතර ඇති සම්බන්ධතාවය රූප සටහනක දක්වන්න. (ලකුණු 02යි)

ආ. ආවෘත ආර්ථිකයකට අදාල පහත සඳහන් තොරතුරු හා සමීකරණ දී ඇත. (වටිනාකම රු. මිලියන)

ස්වාධින පරිභෝජනය 180

වැයකළ හැකි ආදායම ඉහල යන සෑම ඒකකයකින්ම 60% පරිභෝජනයට වෙන් කරනු ලබයි.

| | |
|---|---|
| ස්ථාවර පෞද්ගලික ආයෝජන ඉල්ලුම | 120 |
| රජයේ බදු ආදායම | 150 |
| සංක්‍රාම ගෙවීම | 90 |
| අයවැය හිඟය | 140 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ. රජයේ මිලදී ගැනීම

ආ. සමතුලික ජාතික ආදායම

ඉ. සමතුලිත ජාතික ආදායමේදී සාමාන්‍ය ඉතුරුම් නැමියාව (APS) කොපමණද?

ඊ. අනිකුත් කරුණු ස්ථාවරව තිබියදී රජයේ මිලදී ගැනීම රු.මි. 50 කින් ඉහල ගියේ නම්

a. ජාතික ආදායමේ කෙතරම් ප්‍රමාණයකින් ඉහළ යාහැකි ද?

b. පරිභෝජන ඉල්ලුම (පෙළඹුම් පරිභෝජනය) ඉහළ යා හැකි ප්‍රමාණය කොපමණද ?

(ලකුණු 02යි)

24. (i) කිසියම් වර්ෂයකදී රටක දළ දේශීය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට අවශ්‍යයෙන්ම සමාන විය යුතු යැයි ඔබ සිතන්නේද?

(ලකුණු 04යි)

(ii) දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී ඇතුලත් කෙරෙන ආර්ථික කටයුතු මොනවාද?

(ලකුණු 04යි)

(iii) රාජ්‍ය කටයුතු සහිත විවෘත ආර්ථිකයක ජාතික ආදායමේ සමතුලිතතාවය වෙනස් කිරීමට බලපාන සාධක නම් කරන්න.

(ලකුණු 04යි)

(iv) කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 40 + 0.6y$ බව සලකන්න. ඊට අදාල ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කර එම ශ්‍රිතයන් අතර සම්බන්ධතාවය දැක්වෙන ප්‍රස්තාර සටහන නිර්මාණය කරන්න.

(ලකුණු 04යි)

(v) මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම රු.මි. 500 ක් ලෙස තිරණය වීමට නම් සමාහාර ඉල්ලුමට එකතු විය යුතු ආයෝජන ඉල්ලුම කොපමණද?

(ලකුණු 04යි)

25. (i) ආර්ථික විද්‍යා ප්‍රශ්නයකට ශිෂයකු විසින් සපයන ලද පිළිතුරක කොටසක් පහත දැක්වේ.

රටක සියළුම නිෂ්පාදන ආයතනවල නිමැවුමේ මුල්‍යමය වටිනාකම ඇස්තමේන්තු කර ඒවා එකට එකතු කිරීමෙන් අදාල වර්ෂයේ දල දේශීය නිෂ්පාදිතය ගණනය කල හැක. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(ii) කිසියම් ආර්ථිකයක් සම්බන්ධ පහත තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| ආන්තික පාරිභෝජන නැම්යාව (MPC) | - | 0.75 |
| ආයෝජනය (I) | - | 225 |
| ස්වාධීන පරිභෝජනය (a) | - | 150 |

(අ) සමතුලිත නිමැවුම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) සමස්ත වියදම සමස්ත කාන්දුවීම හා සමස්ත විදීම් රේඛා ප්‍රස්තාරයක දක්වන්න.

(ලකුණු 02යි)

(iii) විවෘත ආර්ථිකයක සමතුලිත ආදායම තීරණය වීම සඳහා ඉටු විය යුතු කොන්දේසි කවරේද? එම ආර්ථිකයේ කාන්දුවීම් නම් කොට ඒවා කාන්දුවීම් ලෙස සලකන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04යි)

(iv) කුටුම්භ නිෂ්පාදන ඒකක සහ රජය යන ආර්ථික කාරක අතර පවත්නා අන්තර් සම්බන්ධතාවය රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) වැය කල හැකි ආදායමට අතිරේකව පරිභෝජන වියදම තීරණය වීම කෙරෙහි බලපාන වෙනත් සාධක මොනවාද? (ලකුණු 04යි)